# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2216/39 - 2021 පෙබරවාරි මස 27 වැනි සෙනසුරාදා - 2021.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වැනි වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක ජී. එල්. 24 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඈ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2019 අප්‍රේල් මස 23 වැනි දින අංක 2120/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ නිශ්චිතව දැක්වෙන "ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. මූල්‍ය ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) සම්බන්ධයෙන් වන අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීම සඳහා වන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව විෂයය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම විය යුතු ය.

2. අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (එස්එල්කිවුඑෆ් 8 වන මට්ටම) යනුවෙන් නම් කරන ලද අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීම සඳහා වන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම -

(i) (අ) ආදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යයන සම්භාර 30ක් ඇතුළුව ; හෝ

(ආ) පූර්ව අධ්‍යයන හෝ රැකියා පළපුරුද්ද මත අධ්‍යයන සම්භාර 30 ක අදළ විෂයය ක්ෂේත්‍රයේ.

උපාධියක් ලබා තිබීම ; හෝ

(ii) (i) (අ) වන හෝ (i )(ආ) වන ඡේදයන්ට සමාන අදළ විෂයය ක්ෂේත්‍රයේ සුදුසුකමක් ; හෝ

(iii) නිශ්චිත බලධරයා විසින් නිශ්චය කළ හැකි පරිදි එන්වීකිවු 7 වන මට්ටම සම්පූර්ණ කිරීම.

විය යුතු ය.

3. මේ නියමය පළ කරනු ලබන දින සිට සෑම අවුරුදු පහකට (5) වරක්, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වෙන උපාධි ප්‍රදානය කිරීම සඳහා, නිශ්චිත බලධරයා විසින් විෂය ප්‍රතිසමාලෝචනයක් පවත්වනු ලැබිය යුතු ය.

***II වන උපලේඛනය***

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| මූල්‍ය ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (මූල්‍ය ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය) |
| අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පීජීඩිප් (අධ්‍යාපන) |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2021 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03 - 326

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.